# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,032 - 2017 අගෝස්තු මස 11 වැනි සිකුරාදා - 2017.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1426 | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| | | බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| | | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2017 ජූලි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත 2017 ජූලි මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 අගෝස්තු මස 31 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අගෝස්තු මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය* *www. documents.gov. lk* *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## නිවේදනයයි

1989 අංක 12 දරන පළාත්සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමඟ කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ නියෝගය.

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමඟ කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2 (2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව වයඹ පළාත් සභාවේ පළාත් මාර්ග ප්‍රවාහන, සමුපකාර, වෙළඳ, නිවාස, ඉදිකිරීම් කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන ආමාත්‍ය ආර්. පී. ඩී. ගුණදාස දෙහිගම වන මම, වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්ට සහාය වීමට පත්කර ඇත්තාවූ මීට අමුණා ඇති උපලේඛනයේ I වැනි තීරුවෙහි සඳහන් අයට 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීතිමාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තාවූ එකී උපලේඛනයේ III වැනි තීරුවෙහි සඳහන් සියළුම බලතල එකී උපලේඛනයේ II වැනි තීරුවෙහි සඳහන් දින සිට මෙයින් පවරමි.

ආර්. පී. ඩී. ගුණදාස දෙහිගම,
වයඹ පළාත් සභාවේ පළාත් මාර්ග ප්‍රවාහන, සමුපකාර,
වෙළඳ, නිවාස, ඉදිකිරීම් කර්මාන්ත සහ
ග්‍රාම සංවර්ධන අමාත්‍ය.

2017 ජූලි මස 17 වැනි දින,
කුරුණෑගල දී ය.

### උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| මන්නව අච්චිගේ මල්කාන්ති පියසේන | 2017.06.28 | සමුපකාර සමිති පනතේ 3, 5, 6, 7, 8, 9, 33, 39, 44, 44(6),45, 46, 48, 49, 50, 52, 53, 54, 58 [58(3) සහ 58 (5) හැර] 59, 68 සහ 72 යන වගන්ති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියළු බලතල රීති මාලාවේ 4, 11, 15, 16(II), 18, 19, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49 [49(XII) හැර] 51, 52 සහ 53 දරන රීති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියළු බලතල. |

08-236

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.